**බිබිල ප්‍රාදේශීය සභාව - 2022**

**-----------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

බිබිල ප්‍රාදේශීය සභාවේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශය, මුදල් ප්‍රවාහ ප්‍රකාශය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට බිබිල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පළාත් පාලන ආයතන සඳහා වූ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.
ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

### 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව

විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක  සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක  සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින්  විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවියහැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම්කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද ,අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත්වී ඇතිබව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත්කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ  ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

### 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් මාසය තුල සෘජු ප්‍රේෂණ ලෙස ලැබී තිබුණු රු.150,000 ක සතොස කඩ කුලී ආදායම හඳුනාගෙන ගිණුම්ගත කර නොතිබුණි. | මෙය 2023 වර්ෂයේ දී නිවැරදි කරන බව කාරුණිකව දන්වමි. | සියලුම ආදායම් හඳුනාගෙන මූල්‍ය ප්‍රකාශනවල ඇතුලත් කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ ජංගම වගකීම් තුළ දේශීය ණය හා සංවර්ධන අරමුදලට ගෙවිය යුතු මුදල රු.204,515 ක් සහ ජංගම නොවන වගකීම් තුළ දේශීය ණය සහ සංවර්ධන අරමුදලට ගෙවිය යුතු මුදල ලෙස රු.309,322 ක් අඩුවෙන් දක්වා තිබුණි. | දේශීය ණය සංවර්ධන අරමුදලට ගෙවිය යුතු මුළු මුදල ජංගම හා ජංගම නොවන ලෙස වෙන්කිරීමේදී මෙම වරද සිදු වී ඇති අතර 2023 වර්ෂයේදි තවදුරටත් පරික්ෂා කර බලා නිවැරදි කර ගිණුම් ගතකරන බව කාරුණිකව දන්වමි. | නිවැරදිව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතුය. |
| (ඇ) | 2022 වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වැඩ අවසන් කර තිබුණු රු.1,769,454 ක් වටිනා කර්මාන්ත 04 ක වටිනාකම ප්‍රාග්ධනිත කර නොතිබුණි. | මෙම කර්මාන්ත වටිනාකම 2023 වර්ෂයේ ගිණුම සකස් කරන විට ප්‍රාග්ධනිත කරන බව කාරුණිකව දන්වමි. | නිවැරදි වටිනාකම් මූල්‍ය ප්‍රකාශනවල ඇතුලත් කළ යුතුය. |
| (ඈ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හිඟ මුද්දර ගාස්තු ශේෂය රු. 8,347,185 ක් වුවත් එය මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ රු. 5,937,780 ක් ලෙස දක්වා තිබුණි. තවද සමාලෝචිත වර්ෂයේ මුද්දර ගාස්තු ආදායම රු. 2,318,488 ක් අඩුවෙන් ගිණුම්ගතකර තිබුණි. | මෙම වරද 2023 වර්ෂයේ ගිණුම සකස් කරන විට නිවැරදි කරන බව කාරුනිකව දන්වමි. | -එම- |
| (ඉ) | සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කරන ලද මූල්‍ය ප්‍රකාශන තුල විගණන ගාස්තු සඳහා ප්‍රතිපාදන වෙන්කර නොතිබුණි. | 2023 වර්ෂයේ ගිණුම සකස් කරන විට නිවැරදි කරන බව කාරුණිකව දන්වමි. | මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිමේදි වෙන් කිරිම් නිවැරදිව සිදුකළ යුතුය. |

### 1.6.2 නොසැසඳුණු ගිණුම්

| විගණන නිරීක්ෂණය | | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ප්‍රාදේශීය සභාව විසින් පවත්වාගෙන යනු ලබන ස්ථාවර වත්කම් ලේඛනය අනුව ගොඩනැගිලි 02 ක වටිනාකම රු.49,063,001 ක් වුවත් මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ එය රු. 49,307,573 ක් ලෙස දක්වා තිබුණි. | මෙම වරද 2023 වර්ෂයේ ගිණුම සකස් කරන විට නිවැරදි කරන බව කාරුණිකව දන්වා සිටිමි. | නිවැරදි වටිනාකම් මූල්‍ය ප්‍රකාශනවල ඇතුලත් කළ යුතුය |
| (ආ) | සභාව විසින් පවත්වාගෙන යනු ලබන ස්ථාවර වත්කම් ලේඛනයට අනුව වාහන 03 ක වටිනාකම හා මූල්‍ය ප්‍රකාශනවල එම වාහන සඳහා දක්වා ඇති වටිනාකම අතර රු.1,043,000 ක වෙනසක් නිරීක්ෂණය විය. | 2023 වර්ෂයේදී ගිණුම සකස් කරන විට එය නිවැරදි කරන බව කාරුණිකව දන්වමි. | -එම- |

### 1.6.3 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| එකතු වටිනාකම රු.81,330,258 ක් වූ වත්කම් විෂයයන් 03 ක් සම්බන්ධයෙන් ස්ථාවර වත්කම් ලේඛන සහ අස්පෘෂ්‍ය වත්කම් ඇතුලත් ලේඛනය ඉදිරිපත් නොකිරීම නිසා ඒවායේ වටිනාකම්වල නිරවද්‍ය බව පිළිබඳව විගණනයේදී සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට නොහැකි විය. | ඉදිරියේදී අදාළ ලේඛන සකස්කර ඉදිරිපත් කිරීමට කටයුතු කරමි. | සභාව සතුව පවත්නා වත්කම් නිවැරදිව ලේඛනගත කළයුතු අතර එම ලේඛන යාවත්කාලීනව පවත්වා ගෙන යා යුතුය. |

### 1.7 අනුකූල නොවීම්
**නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත | | | |
| (ii)154(1) වගන්තිය | ප්‍රාදේශීය සභා සීමාව ඇතුළත වෙන්දේසි කරන ඉඩමක එම ඉඩම විකිණීමෙන් ලත් මුදලින් සියයට 1 ක මුදලක් ප්‍රාදේශීය සභාවට අයකරගත යුතු වුවත් බිබිල ප්‍රාදේශීය සභා සීමාවේ වෙන්දේසි කරන ලද ඉඩම් 190 කින් අදාල බදු මුදල් අයකරගෙන නොතිබුණි. | ප්‍රාදේශීය සභාවට අය විය යුතු සියයට 1 ක බදු මුදල් ගෙවා නිම කරන ලෙස අදාල දේපල සමාගම දැනුවත් කර ඇත. | ප්‍රාදේශීය සභා සීමාව තුල වෙන්දේසි කරන ඉඩම් සම්බන්ධයෙන් ප්‍රාදේශීය සභා පනත අනුව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 572 | වසර 02 ඉක්ම වූ රු.596,783 ක පොදු තැන්පත් ශේෂ නියාදනය කර නොතිබුණි. | වසර 02 ඉක්මවා තැන්පත් ලේඛනවල පවතින තැන්පත් මුදල් සම්බන්ධයෙන් තැන්පත්කරුවන් හට සිහිකැඳවීම් ලිපියවා මුදල් නිදහස් කිරීමටත් ඉදිපත් නොවන තැන්පත් කරුවන්ගේ මුදල් සහා ආදායමට ගැනීමටත් කටයුතු කරමි. | වසර 02 ඉක්මවූ තැන්පත් ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි අනුව කටයුතු කළ යුතුය. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 18,142,593 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 34,675,307ක් විය.

**2.2 ආදායම් පරිපාලනය**

**2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්**

සභාපතිවරයා විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2022 | | | | 2021 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | | ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 12,785,798 | 9,668,114 | 2,441,188 | 7,226,926 | 9,261,367 | 8,218,569 | 2,037,712 | 6,180,857 |
| (ii) | කුලී | 24,130,946 | 23,375,625 | 16,898,884 | 6,476,740 | 24,319,881 | 20,295,167 | 13,769,660 | 6,525,506 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 2,040,400 | 1,737,350 | 1,457,900 | 279,450 | 2,350,700 | 1,259,080 | 1,141,030 | 118,050 |
| (iv) | වෙනත් ආදායම් | 3,392,500 | 25,434,313 | 13,563,160 | 11,871,153 | 13,417,500 | 35,227,751 | 28,284,837 | 6,942,914 |
| | එකතුව | 42,349,644 | 60,215,402 | 34,361,132 | 25,854,269 | 49,349,448 | 65,000,567 | 45,233,239 | 19,767,327 |

**2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය**

සභාවේ ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය සම්බන්ධ නිරීක්ෂණ පහත දැක්වේ.

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) සමාලෝචිත වර්ෂයේ බිල්කරන ලද රු.60,215,402 ක් වූ මුළු ආදායමෙන් වර්ෂය අවසාන වන විට රු.25,854,269 ක් අයකර නොතිබුණු අතර එය මුළු බිල්කළ ආදායමෙන් සියයට 42 ක් විය. | 2021/2022 වර්ෂවලදී පැවති කොවිඩ් වසංගතය හේතුවෙන් ක්ෂේත්‍රයට ගොස් මුදල් එකතු කිරීමේ කටයුතු සිදු කිරීමට අපහසු වීම හා රට තුළ පැවති අයහපත් ආර්ථික තත්ත්වය මෙයට බලපා ඇත. | බිල් කළ ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | 2014 වර්ෂයට පෙර සිට සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින දක්වා අයකරගත යුතු වරිපනම් බදු රු. 6,035,662 ක් තව දුරටත් අයවිය යුතුව පැවතුණි. | එම මුදල අයකර ගැනීම සඳහා වරිපනම් බදුකරුවන් දැනුවත් කරමින් හිඟ ලිපි යවන ලදි .තවදුරටත් පවතින හිඟ මුදල් අයකර ගැනීම සඳහා ජංගම සේවා හා දේපළ තහනම් කිරීමේ වැඩසටහනක්ද සිදුකරන ලද බව කාරුණිකව දන්වමි. | සභාවට ලැබිය යුතු හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | සභාව සතු දේපළ 14 ක් බදුදීම වෙනුවෙන් 2007 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින දක්වා රු. 4,191,080 ක බදු ආදායමක් අයකරගෙන නොතිබුණි. | හිඟ අයකර ගැනීමට කටයුතු කමින් පවතින බව කාරුණිකව දන්වමි. | සභාවට ලැබිය යුතු හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඈ) | සභාවට අයත් කඩ කාමර 178 කට අදාලව 2016 වර්ෂයේ සිට අයවිය යුතුව පවතින රු.2,311,948 ක් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් අයකරගෙන නොතිබුණි. | මේ වන විට අයවීමට ඇති හිඟ කඩ කුලී ආදායම් කඩිනමින් අයකර ගැනීමට අවශ්‍ය කටයුතු සිදුකරන බව කාරුණිකව දන්වමි. | සභාවට ලැබිය යුතු හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඉ) | ප්‍රාදේශීය සභාවට අයත් ජල ව්‍යාපෘතියේ ජල පාරිභෝගිකයන් 724 කගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අයවිය යුතු රු.1,163,228 ක හිඟ ජල ගාස්තු අයකරගෙන නොතිබුණි. | 2022 වර්ෂයේ හිඟ ජල මුදල් ගෙවීමට සියළුම ජල පාරිභෝගිකයින් ලිපි මගින් දැනුවත් කර ඇති අතර හිඟ ජල මුදල් නොගෙවූ ජල පාරිභෝගිකයින්ගේ ජල සම්බන්ධතා විසන්ධි කිරීමට අදාල කටයුතු සිදුකරමින් පවතී. | සභාවට ලැබිය යුතු හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඊ) | සභා බලප්‍රදේශය තුළ විවිධ ආයතන/පුද්ගලයින් විසින් ප්‍රදර්ශනය කර තිබුණු ස්ථාවර ප්‍රචාරක දැන්වීම් පුවරු 13 කින් 2020 වරෂයේ සිට සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින දක්වා අයවිය යුතු රු. 279,450 ක මුදලක් අයකර ගෙන නොතිබුණි. | හිඟ ස්ථාවර ප්‍රචාරක දැන්වීම් පුවරු ගාස්තු අයකර ගැනීමට කටයුතු කරමින් පවතී. | ආදායම් පරික්ෂක නිලධාරීන් විසින් සමීක්ෂණ කටයුතු සිදුකර දැන්වීම් පුවරු හඳුනාගෙන ගාස්තු අයකරගත යුතුය. |
| (උ) | පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබුණු උසාවි දඩ රු.784,647 ක් සහ මුද්දර ගාස්තු රු.8,347,185 ක් ගෙන්වාගෙන නොතිබුණි. | හිඟ මුදලින් කොටසක් ලැබී ඇති බවත් ඉතිරි හිඟ ලබා ගැනීමට කටයුතු කරන බවත් දන්වා සිටිමි. | සභාවට ලැබිය යුතු හිඟ ආදායම් ගෙන්වා ගැනීමට කටයුතු කළ යුතුය. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 ආර්ථික නොවූ ගණුදෙනු**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ප්‍රාදේශීය සභාවේ අරමුදල් මගින් දිවා සුරැකුම් මධ්‍යස්ථානයක් සහ ආයුර්වේද හා මහජන උපයෝගීතා සේවා මධ්‍යස්ථානයක් ඉදිකිරීම සඳහා ලංසු ආරාධනා කිරීමට පුවත්පත් දැන්වීම් වෙනුවෙන් 2022 අප්‍රේල් 26 දින රු. 128,887 ක් ගෙවීම් කර තිබුණු නමුත් ප්‍රසම්පාදන කටයුතු සිදුකර ඉදිකිරීම් ආරම්භ කර නොතිබුණි. | මෙම ව්‍යාපෘතිය සඳහා අවශ්‍ය ප්‍රතිපාදන සලසා ගත් පසු ක්‍රියාත්මක කරන බව දන්වමි. | ප්‍රසම්පාදන දැන්වීම් පලකිරීමට පෙර ප්‍රතිපාදන සළසා ගැනීම හා මූලික ප්‍රසම්පාදන ක්‍රියා සිදු කළ යුතුය. |

**3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභාව විසින් අවසන්වරට 2009 වර්ෂයේ දී වරිපනම් බදු තක්සේරුව සිදුකර තිබුණු අතර කාලීනව තක්සේරු කිරීම් සිදුකර නොතිබුණි. | තක්සේරු කිරිමේ කාර්යය සඳහා අවශ්‍ය කටයුතු මේ වන විට සිදු කරමින් පවතින බව දන්වමි. | වරිපනම් බදු කාලීනව තක්සේරු කිරිම කළ යුතුය. |

**3.3 මානව සම්පත් කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සභාවේ තනතුරු 07 කට අදාලව අනුමත කාර්ය මණ්ඩලය අනුව සේවකයින් 12 දෙනෙකුගේ ඌනතාවයක් පැවති අතර එම පුරප්පාඩු පිරවීමට කටයුතු කර නොතිබුණි. | කාර්ය මණ්ඩල වාර්තාවට අනුව අනුමත කාර්ය මණ්ඩල වාර්තාවේ පවතින පුරප්පාඩු ඇතුලත් වාර්තාවක් සෑම මසකම ආරම්භයේ පළාත් පාලන සහකාර කොමසාරිස් හා පළාත් පාලන කොමසාරිස් වෙත ලබාදෙන බව දන්වමි. | කාර්ය මණ්ඩල පුරප්පාඩු පුරවා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂය ආරම්භයේදී නිලධාරීන් 03 දෙනෙකු හට රු.69,450 ක් සහ වර්ෂය තුළදී නිලධාරීන් 05 දෙනෙකු හට රු.134,215 ක් වශයෙන් ලබාදිය හැකි උපරිම සීමාව ඉක්මවා ආපදා ණය ලබාදී තිබුණි. | මින් ඉදිරියට රු.250,000 ක සීමාවට යටත්ව ආපදා ණය නිකුතු කරන බවත් මේ වන විටත් රු.250,000 සීමාව ඉක්මවා ගෙවා ඇති ආපදා ණය මුදල් වාරික කිහිපයකින් අයකර ගැනීමට කටයුතු කරමි. | නිලධාරියෙකු වෙත ණය ලබා දීමේදි උපරිම ණය සීමාව නොඉක්මවිය යුතුය. |

**4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය**

**4.1 අයවැය පාලනය**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ප්‍රාදේශීය සභාව විසින් පිළියෙලකර තිබුණු අයවැය ලේඛනය මඟින් ඇස්තමේන්තු කළ ආදායම් හා වර්ෂයේ තථ්‍ය ආදායම් අතර සියයට 3 සිට සියයට 146 දක්වාද ,වර්ෂයේ ඇස්තමේන්තු කළ විදම් හා තථ්‍ය වියදම් අතර සියයට 6 සිට සියයට 72 දක්වාද සැළකිය යුතු විචලනයක් පවතින බැවින් ආදායම් හා වියදම් පාලනයේදී අයවැය ලේඛනය ඵලදායී පාලන කාරකයක් ලෙස යොදාගෙන .නොතිබුණි | රට තුළ පැවති කොවිඩ් වසංගත තත්වය හා රටේ පැවති අහිතකර දේශපාලන වාතාවරණ හේතුවෙන් මෙවැනි තත්ත්වයක් ඇති වූ අතර 2023 වර්ෂයේදී විචලනයන් අවම වන පරිදි අයවැය ලේඛනය යොදාගැනීමට කටයුතු කරමි. | නිවැරදි අයවැය ලේඛනයක් පිළියෙල කර එහි දක්වා ඇති ඉලක්ක සපුරාගත යුතුය. |